සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
# கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
# General Certificate of Education (Adv. Level) Examination, 2024

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 13 | චිත්‍ර කලාව I — 51 S I | අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි | කාලය / நேரம் / Time පැය තුනයි |

නම / பெயர் / Name ..................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....................

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:
- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය.

I කොටස
- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේම** සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට නිවැරදි පළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **තිත් ඉර මත** ලියන්න.

II කොටස
- අනුකොටස් **තුනකින්** සමන්විතය.
- "අ" කොටසින් ප්‍රශ්න දෙකක් සහ "ආ" සහ "ඉ" යන කොටස් දෙකෙන් එක්ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- I කොටස හා II කොටසට අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

| I පත්‍රය සඳහා | |
|---|---|
| I කොටස | |
| II කොටස | |
| එකතුව | |

## I කොටස

- ප්‍රශ්න අංක 1 සිට 5 තෙක් එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** තෝරන්න.

1. යාපහුවේ ශෛලමය පාදම් ආශ්‍රිත ව කැටයම් අතර දක්නට ලැබෙන නටන වයන කාන්තා රූප ඉරියව් දෙස බැලීමේ දී
   (1) රූපවල මුහුණෙහි හැඟීම්බර සිනාමුසු බවක් දැකිය හැකි ය.
   (2) ලාලිත්‍යමය නම්‍යශීලී ස්වරූපයක් පළ කරයි.
   (3) ත්‍රිභංග ඉරියවුවෙන් එක් අතකින් යමක් දරා ඉදිරිය දෙසබලා සිටින ආකාරයක් පෙන්නුම් කරයි.
   (4) ස්ත්‍රී රූප නර්ථනයේ යෙදෙන විලාසයක් ද පුරුෂ රූප වයන විලාසයක්ද පෙන්වයි.
   (5) පාර්ශවදර්ශී අඛණ්ඩ කථන ක්‍රමයෙන් කැටයම් කර ඇති ආකාරයක් පෙන්වයි. (.............)

2. 43 කණ්ඩායම පුරෝගාමී ශිල්පියෙකු වූ අයිවන් පීරිස් මහතා තම බොහෝ සිතුවම් තුළින්
   (1) වර්ණ භාවිතයේ විසංගත බව මඟින් චිත්‍රයේ ප්‍රකාශනවාදී බව තීව්‍ර කරයි.
   (2) ඝනිකවාදී ආකෘතියක් මත චිත්‍රයේ කලාත්මක භාෂාවක් ගොඩනගයි.
   (3) නිශ්චල සහ නිහඬ ශාන්ත භාවයක් ප්‍රකාශ කරයි.
   (4) වෙරළ ආශ්‍රිත ජනජීවිතය ප්‍රකාශනාත්මකව ඉදිරිපත් කරයි.
   (5) දීප්තිමත් පැතලි වර්ණ, ඝන බාහිර රේඛා මඟින් දෘශ්‍යමය අත්දැකීම් ප්‍රකාශයට පත් කරයි. (.............)

3. චෝල කලා නිර්මාණයක් වනුයේ
   (1) කල්‍යාණ සුන්දර මූර්තිය යි.
   (2) වෙරළේ දේවාලය යි.
   (3) ආකාශ ගංගාරෝහණය කැටයම යි.
   (4) යෝගාසන දේව රූපය යි.
   (5) ජමල්පූර් පිළිමය යි. (.............)


4. "අසංකාසුර සම්හාරම්" නම් සිතුවම සඳහා
   (1) ඉන්දී ශිල්පියෙකු වූ රාජා රවි වර්මාගේ කලා ලක්ෂණ ආභාස කර ඇත.
   (2) ඉන්දීය නවජීවන ව්‍යාපාරයේ පොදු ලක්ෂණ ආභාස කර ඇත.
   (3) බෙංගාලි ගුරුකුලයේ ශිල්පීය ප්‍රවණතාවය ආභාස වී ඇත.
   (4) ඉන්දීය රාජ්පුත් මෝගල් කලාවේ ආභාසය ලබා ඇත.
   (5) යුරෝපීය නූතන කලාවේ ශෛලීය ලක්ෂණ ආභාස ලබා ඇත. (.............)

5. "පාදම සහිත මේසය" නම් සිතුවම
   (1) පෝල් සෙසාන්ගේ සිතුවමකි.
   (2) මේරි කසාට්ගේ සිතුවමකි.
   (3) පැබ්ලෝ පිකාසෝගේ නිර්මාණයකි.
   (4) ජෝර්ජස් බ්‍රාක්ගේ නිර්මාණයකි.
   (5) එඩ්ගා ඩෙගාගේ සිතුවමකි. (.............)

(දෙවැනි පිටුව බලන්න.

- ප්‍රශ්න අංක 6 සිට 10 තෙක් අසා ඇති ප්‍රශ්නවලට **වඩාත් ගැලපෙන පිළිතුර** 1 සිට **9** තෙක් අංක කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.


1



2



3


4


5


6


7



8



9

6. අමරාවතී කලා ලක්ෂන වලින් යුක්ත පිළිම වන්නේ.
   (1) 1, 4 (2) 2, 3 (3) 2, 8 (4) 6, 4 (5) 8, 3 (.............)
7. කටක හස්ත මුද්‍රාව පෙන්නුම් කරන පිළිම වනුයේ.
   (1) 1,2,3,4 (2) 2,4,7,8 (3) 2,4,,7,9 (4) 4,2,8,9 (5) 4,7,8,9 (.............)
8. කළු ගල් මාධය භාවිතයෙන් නෙළා ඇති පිළිම වනුයේ.
   (1) 1,4,5,7 (2) 2,3,4,8 (3) 2,3,4,9 (4) 2,3,6,9 (5) 3,4,6,9 (.............)
9. ලෝකඩ මාධ්‍ය භාවිතයෙන් නිර්මාණය වූ ප්‍රතිමා වන්නේ.
   (1) 1,4 (2) 1,7 (3) 5,7 (4) 5,8 (5) 7,8 (.............)
10. සිරස්පතක් නිර්මාණය කර ඇති ප්‍රතිමා වන්නේ.
   (1) 1,2 (2) 1,7 (3) 2,9 (4) 6,7 (5) 7,8 (.............)


- ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැලපෙන පිළිතුර** A,B,C,D,E ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.


A


B


C


D


E

11. A රූපයෙන් දැක්වෙනුයේ.
   (1) පොළොන්නරු යුගයට අයත් තිවංක පිළිමගෙයි දක්නට ලැබෙන සිතුවමකි
   (2) පොළොන්නරුවේ තිවංක පිළිම ගෙයි සම්භාව්‍ය සිතුවම් සම්ප්‍රදායට සමාන ලක්ෂණ පෙන්වන සිතුවමකි
   (3) ගල්විහාරයේ අනුරාධපුර යුගයට අයත් සිතුවම් කොටසකි.
   (4) පොළොන්නරුව ලංකාතිලක විහාරයට අයත් සිතුවම් කොටසකි
   (5) අනුරාධපුර යුගයට අයත් ධාතු ගර්භයකින් හමුවූ සිතුවම් කොටසකි. (.............)

(තුන්වැනි පිටුව බලන්න.

12. B රූපයේ දැක්වෙන සිතුවම

(1) අනුරාධපුර රජ කල කාශ්‍යප රජුගේ නිර්මාණයකි,
(2) අනුරාධපුර යුගයට අයත් බෞද්ධාගමික හැඟීම් දනවන සිතුවමකි.
(3) පෙරදිග සම්භාව්‍ය කලා සම්ප්‍රදායේ රීති අනුව සිතුවම් කර ඇති සිතුවමකි.
(4) වියළි බදාමය මත බන්දන මාධ්‍යයකින් නිර්මාණය කර ඇත.
(5) වර්ණවලින් ත්‍රිමාණත්වය ගොඩනගමින් ස්වභාවිකව ඇඳ ඇත. (............)

13. C රූපයේ දැක්වෙන සිතුවම තුළ

(1) අඳුරු වර්ණමාලාවක් සහිත රූප සංරචනයක් දක්නට ලැබේ,
(2) පුළුල් විචිත්‍රවත් වර්ණමාලාවක් මෙන්ම පරිවාර රූප සඳහා උනුසුම් වර්ණ මාලාවක් දක්නට ලැබේ..
(3) සම්භාව්‍ය වර්ණ මාලාවක් ඒකවාර්ණික ප්‍රභේදයන්ගෙන් යුතුව නිර්මාණය කර ඇත.
(4) ඉතා සියුම් රේඛාකරණයක් සහ සංගත වර්ණ මාලාවක් දක්නට ලැබේ.
(5) ස්වභාවික වර්ණ මාලාවක් මගින් ජීවගුනය මනාව ඉස්මතුකර ඇත. (............)

14. D රූපයේ දැක්වෙන සිතුවම සඳහා තේමාවී ඇත්තේ

(1) බුදුන් වහන්සේගේ මාර පාරාජයයි.
(2) බුදුන් වහන්සේගේ කිඹුල්වත් පුරයට වැඩීම යි.
(3) බුදුන් වහන්සේ මහියංගනයට වැඩීම යි.
(4) බුදුන් කැළණියට වැඩීම යි.
(5) බුදුන් නාගදීපයට වැඩම කිරීම යි. (............)

15. E රූපයේ දැක්වෙන සිතුවම.

(1) මහනුවර පහතරට සම්ප්‍රධායේ සිතුවම් දක්නට ලැබෙන කතළුව විහාරයේ සිතුවමකි.
(2) මහනුවර උඩරට සම්ප්‍රධායේ සිතුවම් දක්නට ලැබෙන මැදවල ටැම්පිට විහාරයේ සිතුවමකි.
(3) අනුරාධපුර යුගයට අයත් හිඳගල විහාරයේන් හමුවූ සිතුවම් කොටසකි.
(4) පොළොන්නරුව තිවංක පිළිම ගෙයි මණ්ඩපය ආශ්‍රිතව හමුවූ සිතුවම් කෙටසකි.
(5) ගාලු දිස්ත්‍රික්කයේ තෙල්වත්ත විහාරයේ ඇති සිතුවමකි. (............)


- ප්‍රශ්න අංක **16** සිට **20** තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් යෝග්‍ය වරණය** පහත සඳහන් **F,G,H,I,J** ලෙස නම් කර ඇති කැටයම් ඡායාරූප ඇසුරෙන් තෝරන්න.



F




G



H



I



J

16. F රූපයේ දැක්වෙන ගල් පුවරුව.

(1) ක්‍රියාකාරී සජීවී බවින් සහ ප්‍රකාශන ශක්තියෙන් උසස් අල්ප උන්නත කැටයමකි.
(2) සිද්ධි ගණනාවක් එකම තලයක චිත්‍රාවලියක් සේ සංරචනය කර ඇති කැටයමකි.
(3) වෘත්තාකාර තලයක පොදු ආකෘතියක් අනුගමනය කරමින් රූප සංරචනය කර ඇති කැටයමකි.
(4) ප්‍රාණවත් බවින්. සියුම් බවින් සහ චලන ස්වභාවයෙන් අඩු ශෛලිගත කැටයමකි.
(5) බුදුන්වහන්සේ සංකේතාත්මකව දැක් වූ අමරාවතී කැටයමකි. (............)

(හතරවැනි පිටුව බලන්න.

17. G රූපයේ දැක්වෙන කලාකෘතිය.

(1) පැරණි ශිෂ්ඨාචාරයකින් සොයාගන්නා ලද ශෛලමය කැටයමකි.
(2) හරප්පා නගරයෙන් සොයා ගන්නා ලද දැව මධ්‍ය භාවිතයේන් කරනලද මුද්‍රාවකි.
(3) ප්‍රාග් ඓතිහාසික මානවා විසින් නිර්මාණය කර පැළඳි ආභරණයකි.
(4) ඉන්දු නිම්න වැසියන්ගේ විවිධ සමාජීය තොරතුරු අනාවරණය කරන කලා නිර්මාණයකි.
(5) පාශාන මාධ්‍ය භාවිතයෙන් කරන ලද මිසර මුද්‍රාවකි. (.............)

18. H රූපයේ දැක්වෙන කැටයම හමුවන්නේ.

(1) අනුරාධපුර කුට්ටම් පොකුණෙන්ය
(2) මැදවල ටැම්පිට විහාරයෙන් ය.
(3) ඇම්බැක්ක දේවාලයේ හේවිසි මණ්ඩපයෙන්ය.
(4) පනාවිටිය අම්බලමෙන් ය.
(5) ඇම්බැක්ක දේවාලයේ පිවිසුම වූ වාහල්කඩ ගොඩනැගිල්ලේන්ය. (.............)

19. I රූපයේ දැක්වෙන ස්මාරකය.

(1) ටයිටස් අධිරාජ්‍යයාගේ යුද්ධ ජයග්‍රහණ ස්මරණය කිරීම පිණිස ඩොමිතියන් අධිරාජයා විසින් ඉදි කරන ලද්දකි.
(2) 1 වැනි කන්ස්ටන්ටයින් අධිරාජයාගේ යුද්ධ ජයග්‍රහණ සැමරීම පිණිස ඉදි කර කරන ස්මාරකයකි.
(3) ට්‍රැජන් අධිරාජයාගේ ඩේසියානු යුද්ධ ජයග්‍රහණය සැමැරීමට ඉදි කර තිබේ.
(4) ජුලියස් සීසර් නම් අධිරාජ්‍යවාදියාගේ ජීවන තොරතුරු කියාපාන්නකි.
(5) ඊජිප්තියානු රාජකීය පෞඩත්වය පෙන්වීමට තැනූ දෙවස්ථානයකි. (.............)

20. J රූපයේ දැක්වෙන්නේ .

(1) ලෞරියා නන්දගර් ස්තම්භය යි.
(2) සාරානාත් ස්තම්භ ශීර්ෂය යි.
(3) රුමෙන්දෙයි ස්ථම්භය යි.
(4) සාංචි ස්ථම්භ ශීර්ෂය යි.
(5) රාම්පූර්වා ස්තම්භ ශීර්ෂය යි. (.............)

- ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැලපෙන වරණය** පහත සඳහන් K,L,M,N,O යනුවෙන් නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.



K



L



M



N



O

21. K රූපයෙන් දැක්වෙන ඇල්බා මැඩෝනා සිතුවමෙහි තේමාවට අයත් චරිත ප්‍රකෘති ලෝකයේ මිනිසුන් ලෙස අවධාරණය කිරීමට ශිල්පියා භාවිතකර ඇත්තේ.
(1) චිත්‍රය සංරචනය කිරීමේ දී බසුබිමට යොදා ඇති ගම්බද පරිසරයයි. .
(2) අතිශෝක්තිගත ප්‍රභාමණ්ඩලය හා දේවදූතයින් වැනි ලක්ෂණ බැහැර කිරීමයි.
(3) ඇසට ප්‍රිය විචිත්‍රවත් වර්ණ ඉතා සෞම්‍ය ලෙස යෙදීමයි .
(4) ළදරු රූප තුළ වූ සුකොමළ බව සහ කෙළිලොල් බව පෙන්වීමයි.
(5) සුන්දර වූ ස්වභාවිකත්වය අභිබවා යමින් අතිශය තාත්විකබවක් මතු කිරීමයි. (.............)

(පස්වැනි පිටුව බලන්න.

22. G රූපයෙන් දැක්වෙන "පුටුව" නැමති සිතුවම තුළින්
   (1) යුරෝපයේ ශාස්ත්‍රාලයීය යතාර්තවාදී කලාවේ ලක්ෂණ පෙන්වයි.
   (II) උපස්ථිතිවාදී කලාවට එදිරි ප්‍රතික්‍රියාවක් ලෙස බිහිවූ පශ්චාත් උපස්ථිතිවාදී කලා ලක්ෂණ පෙන්වයි .
   (III) උපස්ථිතිවාදී කලා ලක්ෂණ පෙන්වයි.
   (IV) කැඩි වේගවත් පින්සල් පහර තුළින් මතු කරන භාවය සහ ඝණිකවාදී ආකෘතිය මනාව ස්මතුකරයි. .
   (V) සම්ප්‍රධායික නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනයෙන් මිදී දෛනික ලෝකයේ වස්තුන් ව්‍යුක්ත කරණය කර ඇත..(.............)

23. H රූපයෙන් දැක්වෙන සිතුවම
   (1) ජේ.ඩී.ඒ.පෙරේරා ශිල්පියාගේ සිතුවමකි
   (II) ස්ටැන්ලි අබේසිංහ මහතාගේ මුල්කාලීන ආලේඛ්‍ය සිතුවමකි.
   (III) ජස්ටින් දැරණියගල මහතාගේ සිතුවමකි.
   (IV) හැරී පීරිස් මහතාගේ සිතුවමකි.
   (V) රිචඩ් ගේබ්‍රියල් මහතාගේ සිතුවමකි. (.............)

24. I රූපයෙන් දැක්වෙන සිතුවම තුළ වර්ණ භාවිතය සහ හැඩතල භාවිතය තුළ.
   (1) ඝණිකවාදී වැඩතල දීප්තිමත් වර්ණ අතර සුසංයෝගයක් පෙන්වයි.
   (II) සාම්ප්‍රධායික වර්ණ රටාවන් ව්‍යුක්ත රූපික හැඩතල මඟින් ප්‍රතිනිර්මාණය කරයි.
   (III) ජ්‍යාමිතික රූපී ව්‍යුහයක් සහිත ආකෘතියක් භාවිත කරමින් ශීත උණුසුම් වර්ණ එකිනෙකට එදිරිව භාවිත කරයි .
   (IV) ස්වභාවිකවාදී හැඩතල සංගත වර්ණ මාලාවක් සමග එකතුවකි.
   (V) ජ්‍යාමිතික හැඩතල හා සම්භාව්‍ය වර්ණ අතර විචිත්‍ර බව පෙන්වයි. (.............)

25. J රූපයෙන් දැක්වෙන සිතුවමින් .
   (1) ශිල්පියාගේ ජනප්‍රිය තේමාවක් වන මාතෘත්වය ඉදිරිපත් කර ඇත.
   (II) ශිල්පියා තරමක් විප්ලවීය ස්වභාවයකින් යුතු සංරචනයක් ඉදිරිපත් කරයි.
   (III) ශිල්පියා උපස්ථිතිවාදීන් මෙන් චිත්‍රයෙන් එළිමහන් දර්ශනයක් නිරූපණය කරයි.
   (IV) මධ්‍යකාලීන වර්ණ ගැන්වූ වීදුරු සිතුවම් ආදී මූලාශ්‍ර තුළින් ස්ව දෘෂ්‍ය භාෂාව ගොඩනගා ගත් අයුරු පෙන්වයි
   (V) ප්‍රකෘති ලෝකයේ සාමාන්‍ය තේමාවක් ඉතා සංවේදී අයුරි ප්‍රකාශ කරයි. (.............)

- ප්‍රශ්න අංක **26** සිට **30** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තොරන්න.

26. ව්‍යාප්ත මොස්තරයක තිබිය යුතු මූලික අවශ්‍යතාවයක් වනුයේ.
   (1) නිර්මාණාත්මක බවයි.
   (II) කර්මාන්තයට උචිත බව.
   (III) විචිත්‍රවත් බව.
   (IV) සමබරතාවය.
   (V) සැලසුම්සහගත බව. (.............)

27. චිත්‍ර සංරචනයේ දී වඩාත් වැදගත් වනුයේ.
   (1) ස්වභාවිකත්වය දනවන අයුරින් වර්ණ භාවිත කිරීමයි.
   (II) උචිත වාතාවරණය හා පරිසරය ප්‍රකාශ කර ඇති ආකාරයයි.
   (III) සිද්ධාන්ත භාවිතය හා ගතිලක්ෂණ දැක්වීමයි.
   (IV) මානවරූප සහ පරිසරය තාත්වික අයුරින් ප්‍රකාශනය කිරීමයි.
   (V) රිද්මයානුකුල ප්‍රාණපූර්ණ රේඛා හා හැඩතල භාවිතයයි. (.............)

28. කිසියම් කලා කෘතියක ඇති දෘශ්‍ය අරමුණු සමූහය සමස්තයක් වශයෙන් එකට බැඳී ක්‍රියාත්මක වීම
   (1) සුසංයෝගයයි
   (II) සමානුපාතය හෝ අනුපාතයයි.
   (III) රිද්මයයි.
   (IV) වයනයයි.
   (V) ඒකාග්‍රතාවයයි. (.............)

(හයවැනි පිටුව බලන්න.

29. අධියථාර්ථවාදය තුළින්

(1) අතිශෝක්තියට නැගූ යථාර්ථය හා මනස්සාෂ්ටීය ස්වරූපය සුලභ ව අවධාරණය කරයි.
(2) යතා ලෝකයේ පවතින වස්තුවිෂය ඒ අයුරින්ම නිවැරදිව සහ තථ්‍යවාදී ව නිරූපනය කරයි. .
(3) ප්‍රශස්ත සෞන්දර්ය රීතියකින් මිනිස් සිරුර නිරූණය කරයි.
(4) ප්‍රකෘති ලෝකයේ විවිධ වස්තූන් මත ආලෝකය පතිතවන ආකාරය අධ්‍යනය කරයි .
(5) සොබාදහම පිළිබඳ බලවත් අභිරුචිය මතු කරයි. (.............)

30. මින් මුළුතල මෝස්තර සඳහා උචිත මාතෘකා අතරට එක් වන්නේ

(1) සරොම් වාටි මොස්තර,කුඩ රෙදි මෝස්තර, කුෂන් කවර මෝස්තර ය.
(2) තැගි දවටන මෝස්තර,බන්දේසි මෝස්තර, කුෂන් කවර මෝස්තර ය.
(3) කුෂන් කවර මෝස්තර, කුඩ රෙදි මෝස්තර, සබන් දවටන.
(4) බන්දේසි මෝස්තර ,කුඩ රෙදි මෝස්තර, කුෂන් කවර මෝස්තර ය.
(5) මේස රෙදි මොස්තර,කුඩ රෙදි මෝස්තර, ගවුම් රෙදි මෝස්තර ය. (.............)

• ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** ඊට ඉදිරියෙන් දී ඇති වාස්තු විද්‍යා නිර්මාණය ඇසුරෙන් තෝරන්න.

31. මෙම දැවැන්ත වාස්තු විද්‍යා නිර්මාණය.



(1) පැරණි රාජධානි සමයට අයත් සොහොන් ගැබකි.
(2) පැරණි රාජධානි සමයට අයත් තට්ටු මහල් පිරමීඩයකි.
(3) මධ්‍ය රාජධානි සමයට අයත් දේවස්ථානයකි.
(4) නව රාජධානි සමයට අයත් දේවස්ථානයකි..
(5) නව රාජධානි සමයට අයත් සොහොන් ගැබකි. (...........)

32. මෙම වාස්තුවිද්‍යා නිර්මාණය.



(1) අනුරාධපුර යුගයට අයත් පිළිම ගෙයකි.
(2) පොළොන්නරු යුගයට අයත් පිළිම ගෙයකි.
(3) හින්දු ආගමික දේවාලයකි.
(4) පොළොන්නරු යුගයට අයත් රාජමාලිගාවකි.
(5) අනුරාධපුර යුගයට අයත් රාජ මාලිගාවකි. (...........)

33. පොළොන්නරු යුගයට අයත් මෙම ශිව දේවාලය.




(1) පොළොන්නරු යුගයට අයත් පැරණිතම හින්දු ස්මාරකය යි.
(2) 13 වන සියවසේ දී පාණ්ඩ්‍ය ගෘහනිර්මාණ ශිල්පයට අනුව නිර්මාණය කරන ලද්දකි
(3) මුළුමනින් ම කැපූ කළු ගල් වලින් නිමවා ඇති කුඩා දේවාලයකි.
(4) දකුණු ඉන්දීය චෝල ගෘහනිර්මාණ ශෛලිය පෙන්නුම් කරයි.
(5) ක්‍රි ව 11 දී රාජ රාජ නම් චෝල රජු සිය බිසව සිහිවීම පිණිස කරවා ඇත. (...........)

(හත්වැනි පිටුව බලන්න.

34. පල්ලවයින් විසින් ගලින් නෙළන ලද මෙම දේවාලය.

(1) අර්ජුන රථ ලෙස නම් කරයි.
(II) ද්‍රෞපදි රථ ලෙස නම් කරයි.
(III) ධර්මරාජ රථ ලෙස නම් කරයි.
(IV) නකුල සහදේව රථ ලෙස නම් කරයි.
(V) භීම රථ ලෙස නම් කරයි.



(..........)

35. මෙම වාස්තු විද්‍යා නිර්මාණය

(1) 1 වන බුවනෙකබාහු රජු දවස ඉදි කරවන ලද මාලිගයකි.
(II) IV වන බුවනෙකබාහ් රජු දවස ඉදි කරන ලද බල කොටුව
(III) III වික්‍රමබාහු රජු දවස ඉදිකරන ලද දළදා මැඳුරකි.
(IV) මහා පරාක්‍රමබාහු රජතුමා විසින් කරවන ලද රාජ මාලිගයකි.
(V) II වන විමලධර්මසූරිය රජතුමා විසින් ඉදි කරවන ලද දේවාලයකි.



(..........)

- ප්‍රශ්න අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



36. මෙම සිතුවම දක්නට ලැබෙනුයේ.

(1) මුලිගිරිගල විහාරයේ ය.
(II) කරගම්පිටිය සුබෝධාරාම විහාරයේ ය.
(III) තෙල්වත්ත රජ මහ විහාරයේ ය.
(IV) දෙගල්දොරුව විහාරයේ ය...
(V) කතළුවේ පූර්වාරාමය විහාරයේ ය. (..........)

37. මෙම සිතුවමට වස්තු විෂය වී ඇත්තේ.

(1) තේලපත්ත ජාතකයේ එන පෙරහැර දර්ශනය යි.
(II) වෙස්සන්තර ජාතකයේ එන කිරි මව්වරුන්ට තෑගි දීම යි .
(III) සිවි ජාතකයේ එන රාජකීය පෙරහැර යි.
(IV) චුල්ල ධර්මපාල ජාතකයේ ඊර්ෂ්‍යාපරවශ රජු හමුවන අවස්ථාව යි.
(V) වප්මගුල සහ සිදුහත් කුමරුගේ ප්‍රථම ධ්‍යානය යි. (..........)

38. මෙම සිතුවමෙහි ශෛලීය ලක්ෂණ අනුව එය අයත්වන සිතුවම් සම්ප්‍රදාය වන්නේ.
   (1) මහනුවර යුගයේ පහතරට විහාර සිතුවම් සම්ප්‍රදායට යි.
   (2) මහනුවර යුගයේ උඩරට විහාර සිතුවම් සම්ප්‍රදායට යි.
   (3) පොළොන්නරු යුගයේ අවසාන භාගයේ සිතුවම් සම්ප්‍රදායට යි.
   (4) මැද මහනුවර සිතුවම් සම්ප්‍රදායට යි
   (5) මහනුවර යුගයේ මුල් කාලීන සිතුවම් සම්ප්‍රදායට යි (..........)

39. මෙම සිතුවමේ සංරචන ලක්ෂණයක් වනුයේ.
   (1) අඛණ්ඩ කථන ක්‍රමයෙන් යුක්ත වන අතර රූප පාර්ශව දර්ශීව ඉදිරිපත් කිරීමයි
   (2) චිත්‍රයේ සෑම කොටසක්ම මානව රූපවලින් හෝ පසුබිම වස්තූන්ගෙන් පුරවා විස්තරාත්මක ලක්ෂණ පළකිරීම.
   (3) විවිධ ඉරියව් වලින් යුක්ත මානව රූප හා ගස් වැල් ශෛලිගත ස්වභාවයෙන් යුක්ත වීම
   (4) පෙර බිම පසුබිම හා මැද බිම මනාලෙස පෙන්වමින් පර්යාවලෝක ලක්ෂණ දක්වා තිබීම
   (5) චිත්‍රාවලියක් සේ හෝ තීරු සංරචන ලක්ෂණයෙන් බැහැරව තලය පුරා එක් සිද්ධියක් ප්‍රකාශනය කර තිබීම (..........)

40. මෙම සිතුවමෙහි
   (1) ත්‍රිමාණ බව හුවා දැක්වීමට මද වශයෙන් උත්සාහ ගෙන ඇත.
   (2) සරළ සහ රේඛාමය ඇඳුම් පැළඳුම් සහ දේශීය සැරසිළි රටා වලින් යුක්තය.
   (3) විචිත්‍රවත් බවින් යුක්ත වන අතර පසු බිම සඳහා අනන්‍යතාවෙන් යුක්ත ගස් වැල් දක්වා ඇත.
   (4) යුරෝපීය කලාවේ ආභාසය සහිත වර්ණ සහ සැරසිළි අංග එක් කොට තිබීම
   (5) එළිය අඳුර භාවිතයෙන් ත්‍රිමාණ හා පර්යාවලෝක ලක්ෂණ මතු කර ඇත. (..........)

**

(නවවැනි පිටුව බලන්න.

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ශ්‍රේණිය / தரம் / Grade 13 | චිත්‍ර කලාව I | 51 S I

## II කොටස

- මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත ය.
- **"අ"** කොටසින් ප්‍රශ්න දෙකක් හා **"ආ"** සහ **"ඉ"** යන කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තොරාගෙන ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න
  අවශ්‍ය තැන්හි පිළිතුර සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ

### "අ" කොටස
(චිත්‍ර කලාව ඇගයීම සහ රසාස්වාදය - ශ්‍රී ලංකාව)

01 අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා ශ්‍රී ලාංකේය කැටයම් කලාව හරහා විශිෂ්ඨ කලා කෘති රැසක් ලොවට දායාද කිරීමට ලාංකික කලා කරුවා සතු වූ ප්‍රතිභාපූර්ණත්වය අතිශය ප්‍රසංසණීය ය.

(1) ගම්පොළ සහ මහනුවර යුගයන්හි දැව කැටයම් ඇති ස්ථාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

(2) ගම්පොළ යුගයේ කලා කරුවා දැව කැටයම් සඳහා තෝරාගත් තේමාවන් පිළිබඳ ව කෙටියෙන් පහදන්න. (ලකුණු 05)

(3) අනුරාධපුර යුගයේ විශිෂ්ට කලාගාරයක් බඳු වූ ඉසුරුමුණිය විහාරයේ කැටයම් පිළිබඳ ව තේමාව මාධ්‍ය භාවිතය ශිල්පක්‍රම හා කලා ලක්ෂණ පිළිබඳව උදාහරණ සහිතව ඇගයීමක් කරන්න. (ලකුණු 08)

02 ප්‍රතිමා කලාවේ සුවිශේෂී වෙනස්කම් ඇති කල යුගයක් ලෙස පොළොන්නරු යුගය හැඳින්විය හැකිය.

(1) පොළෙන්නරු යුගයට අයත් අධි උන්නත **ශෛලමය හිටි ප්‍රතිමා** දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) පොළොන්නරුව වටදාගෙයි බුද්ධ ප්‍රතිමා ගැන කෙටි විස්තරයක් කරන්න . (ලකුණු 05)

(3) මහායාන තන්ත්‍රයානික ලක්ෂණ පොළොන්නරු යුගයේ ප්‍රතිමා කෙරෙහි බලපා ඇති ආකාරය උදාහරණ සහිතව පහදන්න. (ලකුණු 08)

03 ශ්‍රී ලාංකේය විහාර බිතුසිතුවම් කලාව තුළ නව පිබිදීමක් ඇති කිරීමට 20 වන සියවසේ විහාර සිතුවම් ශිල්පීන් රැසක් පෙරමුණ ගත්හ.

(1) සෝලියස් මෙන්ඩිස් මහතා විසින් සිතුවම් නිර්මාණය කරනලද විහාරස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) බෙල්ලන්විල විහාරයේ දක්නට ලැබෙන සරණ මංගල්‍යය සිතුවම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05)

(3) 20 වන සියවසේ විහාර සිතුවම් ශිල්පීන් අපරදිග පෙරදිග කලා මූල තම සිතුවම් සඳහා භාවිත කර ඇති ආකාරය, උක්ත ශිල්පීන් **දෙදෙනෙකුගේ** සිතුවම් **දෙකක්** ඇසුරින් විමසන්න. (ලකුණු 08)

(දහවැනි පිටුව බලන්න.

"ආ" කොටස

චිත්‍ර කලාව ඇගයීම සහ රසාස්වාදය - ඉන්දියාව

04 ඉන්දියාවේ මෝගල් අධිරාජ්‍ය කේන්ද්‍ර කොටගෙන ක්‍රි.ව 16 සියවසේ දී බිහි වූ මොගල් කලාවත් මෝගල් චිත්‍රකලාවේ බලපෑම ලබා බිහි වූ ප්‍රදේශීය චිත්‍ර ශෛලියක් ලෙස රාජ්පුත් චිත්‍ර කලාවත් ඉන්දීය චිත්‍ර කලාව නව මානයකට යොමු කරයි.

(1) රාජ්පුත් චිත්‍ර කලාව සඳහා තේමා වූ සාහිත්‍ය කෘති දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) "බාබූර් අධිරාජයා උද්‍යාන නිරීක්ෂණය." නම් සිතුවම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05)

(3) රාජ්පුත් චිත්‍රකලාවේ ශෛලිය, ශිල්ප ක්‍රම, මාධ්‍ය භාවිතය හා කලාත්මක ලක්ෂණ පිළිබඳ ව උදාහරණ සහිතව ඇගයීමක් කරන්න.. (ලකුණු 08)

05 යුරෝපීය චිත්‍ර කලාවත් ඉන්දීය පෙරදිග කලාවත් තුළින් පෝෂණය වූ නව ඉන්දීය සිත්තරුන් පිරිසක් විවිධ කලා ව්‍යාපාර සහ ගුරුකුළ ඔස්සේ කලාවේ පෙරළියක් ඇති කළහ.

(1) ඉන්දීය නව ජීවන ව්‍යාපාරයේ පුරෝගාමී සිත්තරුන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(2) රාජා රවි වර්මාගේ සිතුවම්වල දක්නට ලැබෙන යුරෝපීය ශාස්ත්‍රාලයීය ලක්ෂණ පිළිබඳ කෙටියෙන්. පහදන්න. (ලකුණු 05)

(3) ජෙමිනි රෝයි සහ අම්රිතා ෂර්ගිල්ගේ සිතුවම් තුළ වස්තු විෂය හා කලාත්මක ප්‍රයෝග පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08)

"ඉ" කොටස

චිත්‍ර කලාව ඇගයීම සහ රසාස්වාදය - යුරෝපය

06 ක්‍රි.ව 14 - 16 වන සියවස්වල දී යුරෝපයේ විවිධ අංශයන්හි ඇති වූ පිබිදීම දෘෂ්‍ය කලාව තුළ මහත් පෙරළියක් ඇති කිරීමට සමත්වූහ.

(1) පුනරුදයේ ශිල්පියෙකු වන මයිකල් ආන්ජිලෝගේ මූර්ති දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) ශාස්ත්‍රාලයීය යතාර්ථවාදී කලාවේ පොදු ලක්ෂණ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.. (ලකුණු 05)

(3) "පර්වත මස්තකයේ" දෙව මෑණියෝ සහ "පර්නාසස්" සිතුවම් දෙක පිළිබඳ තේමාව, වර්ණ භාවිතය මාධ්‍ය භාවිතය සහ කලා ලක්ෂණ පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 08)

07 ප්‍රාග් ඓතිහාසික යුගයේ විවිධ භූගෝලීය කළාප තුළ මානවයින් තම ජීවින ක්‍රියාධාමය තුළින් ශේෂ වූ දෘෂ්‍යමය සාධක කලාවේ මංපෙත් විවරකරයි.

(1) ප්‍රාග් ඓතිහාසික මානවයින් සිතුවම් ඇඳීම සඳහා භාවිත කළ ශිල්ප ක්‍රම දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) අදි මානවයින් ගේ සිතුවම් සඳහා වස්තුවිෂය වූ කරුණු පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05)

(3) යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පසු ඇරඹි මිසර ශිෂ්ඨාචාරය හරහා ලොවට දායාද වූ වාස්තු විද්‍යා නිර්මාණ පිළිබඳ උදාහරණ සහිත විමසුමක් කරන්න. (ලකුණු 08)

***

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| ශ්‍රේණිය / தரம் / Grade | 13 | චිත්‍ර කලාව II | 51 | S | II | අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි | කාලය / நேரம் / Time | පැය තුනයි |
|---|---|---|---|---|---|---|---|---|

- මල් පොච්චියකට දැමූ අරලිය අත්තක් කොළ හතරක් සහ මලක් සහිත
- සුදු පැහැති කඩදාසියකින් ආවරණය කරන ලද පෙට්ටියක් (උස cm12 පළල cm15 දිග cm20)
- වර්ණවත් රෙදි කැල්ලක්
- සුදු පැහැති පිඟානක තැබූ තීරුවක් කපා ඉවත් කළ පැපොල් ගෙඩියක්
- අඩක් පිරවූ වතුර බොන වීදුරුවක්

ඉහත සඳහන් ද්‍රව්‍ය කට්ටලය ආධාරකයක් මත තබන්න

පහත දැක්වෙන ආදර්ශ චිත්‍රයේ ආකාරයට භාණ්ඩ කට්ටලය සකසන්න.



සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ශ්‍රේණිය / தரம் / Grade 13

චිත්‍ර කලාව I — 51 S I

ලකුණු දීමේ පටිපාටිය
1 පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 11 | 2 | 21 | 2 | 31 | 4 |
| 2 | 3 | 12 | 3 | 22 | 2 | 32 | 2 |
| 3 | 1 | 13 | 2 | 23 | 1 | 33 | 2 |
| 4 | 1 | 14 | 3 | 24 | 3 | 34 | 5 |
| 5 | 4 | 15 | 4 | 25 | 1 | 35 | 1 |
| 6 | 3 | 16 | 1 | 26 | 2 | 36 | 2 |
| 7 | 2 | 17 | 4 | 27 | 2 | 37 | 5 |
| 8 | 4 | 18 | 4 | 28 | 5 | 38 | 1 |
| 9 | 3 | 19 | 1 | 29 | 1 | 39 | 2 |
| 10 | 1 | 20 | 5 | 30 | 4 | 40 | 1 |

01 අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා ශ්‍රී ලාංකේය කැටයම් කලාව හරහා විශිෂ්ඨ කලා කෘති රැසක් ලොවට දායාද කිරීමට ලාංකික කලා කරුවා සතු වූ ප්‍රතිභාපූර්ණත්වය අතිශය ප්‍රසංසණීය ය.

(1) ගම්පොළ සහ මහනුවර යුගයන්හි දැව කැටයම් ඇති ස්ථාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)
(2) ගම්පොළ යුගයේ කලා කරුවා දැව කැටයම් සඳහා තෝරාගත් තේමාවන් පිළිබඳ ව කෙටියෙන් පහදන්න. (ලකුණු 05)
(3) අනුරාධපුර යුගයේ විශිෂ්ට කලාගාරයක් බඳු වූ ඉසුරුමුණිය විහාරයේ කැටයම් පිළිබඳ ව තේමාව මාධ්‍ය භාවිතය ශිල්පක්‍රම හා කලා ලක්‍ෂණ පිළිබඳව උදාහරණ සහිතව ඇගයීමක් කරන්න. (ලකුණු 08)

(1) ගම්පල යුගය - ඇම්බැක්කේ දේවාලය
මහනුවර යුගය - පනාවිටිය අම්බලම
මහනුවර යුගය - දළදා මැදුර. මඟුල්මඩුව

(2) ගම්පල යුගය ඇම්බැක්කේ දේවාලය
- ඇම්බෙක් දේවාලයේ ඇති දික්ගෙය හෙවත් හේවිසි මඩුව සහ වාහල්කඩ යන ගොඩනැගිලි ද්විත්තයේම ලී කැටයම් දක්නට ලැබේ.
- දිග්ගෙහි ඇති පනේල එකසිය විසි අටක් සහ වාහල් වාහල්කඩෙහි ඇති පනේල හතලිහේම කැටයම් දකින්න ලැබෙයි.

මෙහි ඇති කැටයම් අතර
- සත්ත්ව රූප - සිංහයා, හස්තියා, හංසයා හංසපූට්ටුව.
- කල්පිත සත්ත්ව රූප , ගජසිංහ, වෘෂභ කුංජරය , සැරපෙන්දියා , මකරා, කිඳුරා, ඇත්කඳ ලිහිණියා, හේරුණ්ඩ පක්ෂියා
- නිරූඪ සත්ව රූප
- මල් ලියකම් ඇසුරෙන් කල කැටයම් - ලියවැල, බිනරමල. නෙළුම් මල
- ජන ජීවිතය හා සම්බන්ධ කැටයම්.
- මල්ලව පොරය රබන් වයන්නා දරුවෙකුට කිරි පොවන බව අශ්වාරවකයා හේවායා, විදේශීය හේවායා, දේශීය හේවායා,
- වාටි මෝස්තර. (ලීස්තර)

සම්පූර්ණ කැටයම් සංඛ්‍යාව පන්සිය දාහතරකි.
කැටයම් කරන ලද්දේ දෙල්මඩ මූලාචාරියා නැමැති ශිල්පියා විසිනි.
මෙහි තේමා ප්‍රධාන කාණ්ඩ කිහිපයක් යටතේ වර්ග කළ හැකි ය.
- ශිල්පියා සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර සමඟ තමන්ගේ ස්වාධීන තේමා ද කැටයම් සඳහා භාවිත කර තිබීම වැදගත් ය.

(3) අනුරාධපුර යුගයට අයත් ශෛලමය කැටයම් සහිත ස්ථානයකි.
- දෙවන පෑතිස් රජතුමා විසින් කරවන ලදැයි සැලකේ.
- මෙම කැටයම් ඉන්දීය ගුප්ත හා පල්ලව කලා සම්ප්‍රදායවල ආභාසය එළැඹී ඇත.

කැටයම්
ඉසුරුමුණි පෙම් යුවල
මිනිසා සහ ආශ්‍රව හිස
රජ පවුල
ජල ක්‍රීඩා කරන ඇත්තු

- ඉසුරුමුණි පෙම් යුවල ක්‍රිස්තු වර්ෂ හතර පහ සියවස්වලට අයත්ය
- තේමාව ඉසුරුමුණි පෙම් යුවල.
  මේ සඳහා විවිධ මත පවතින අතර ශිව පාර්වතී බවත් සෙබලෙකු හා ඔහුගේ පෙම්වතිය බවත්.
  මංජු ශ්‍රී බෝසතාණන්ගේ වේශයක් බවත්.
- කලුගල් මාධ්‍ය භාවිතය.සතරැස් ගල් පුවරුවක කැටයම් කර ඇත.
- ශිල්ප ක්‍රමය.නෙළීමේ ශිල්ප ක්‍රමයට අර්ධ උන්නතව කැටයම් කර ඇත.
- කලා ලක්ෂණ.ඉන්දීය ගුප්ත කලා ආභාසය සහිත නිර්මාණයකි.
  අලංකාර වස්ත්‍රාභරණයෙන් යුතුවීම ජීව ශක්තියෙන් යුතු පිරිපුන් ශරීරය ප්‍රේමය පිළිබඳ භාවාත්මක හැඟීම තලයට උචිත ලෙස රූප රචනය රිද්මයානුකූල ශාරීර කිරියාව මට සිලිටි නිමාව.

මිනිසා සහ අශ්ව හිස.

- තේමාව.මිනිසා සහ අස්ව අස්ව හිස යනුවෙන් හඳුන්වයි
  යුද සෙබලෙකු සෙනෙවියෙකු කපිල ඍෂිවරයා
  සෙනරත් පරණවිතාන මහතාගේ මතය අනුව අග්නි සහ පර්ජන්නය .
- මාධ්‍ය භාවිතය.- ස්වභාවික ගල් පර්වත බිත්තියේ කැටයම් කර ඇත.
- ශිල්ප ක්‍රමය. -නෙලීමේ ශිල්ප ක්‍රමයට අර්ධ උන්නතව නෙලා ඇත.
- කලා ලක්ෂණ. - ප්‍රතාපවත් බව චාම් ස්වභාවය හා දිගටි මානව හැඩතලවල ස්වරූපය නිසා
  මෙය පල්ලව කලා සම්ප්‍රදායේ බලපෑම් ලැබූ නිර්මාණයක් යැයි සැලකේ.
  රිද්මයානුකූල ඉරියව් මටසිළිටි නිමාව බාවාත්මක හැඟීම් ප්‍රකාශනය දක්ෂ රූප රචනය මෙම කැටයමේ විශේෂ
  ලක්ෂණ වේ.

රජ පවුල කැටයම

- තේමාව - රජ පවුල නමින් හැඳින්වෙන මෙම කැටයම පිළිබඳ සෙනරත් පරණවිතාන මහතා පවසන්නේ කැටයම
  මැද සිටිනරුවෙන් දුටුගැමුණු රජුත් මෙම රූපයට දකුණු පස ඉදිරියට බලා දැත් බැඳ සිටින රුවෙන් සාලිය
  කුමරුත් වම් පස කාන්තාරුවෙන් රජුගේ බිසවත් නිරූපණය වන බවයි.බිසවගේ රුවට වම් පසින් කුඩාවට දක්වා
  ඇති කාන්තා රූපය අශෝක මාලාගේ බව පවසයි.
- මාධ්‍ය භාවිතය. - අර්ධ කවාකාර ගල් පුවරුවක කැටයම් කර ඇත.
- ශිල්ප ක්‍රමය. - අර්ධ උන්නත නෙළීමේ ශිල්ප ක්‍රමයට නිමවා ඇත.
- කලා ලක්ෂණ. - මෙම කැටයම ද ගුප්ත කලාවේ ආභාෂය ලබා ඇති බව
  රිද්මයානුකූල ඉරියව් මට සිළිටි නිමාව විශිෂ්ට සංරචනය හා භාවනාත්මක හැඟීම් ප්‍රකාශනය කැටේ මේ ඇති කැපී
  පෙනෙන කලාත්මක ලක්ෂණ වේ.
  පිරිමි රුවේ රාජ්‍ය ලීලාසන ඉරියව්ව දක්වා ඇත.

ජල ක්‍රීඩා කරන ඇත්තු

- මෙයින් ජල ක්‍රීඩා කරන ඇත්තු පිරිසක් දක්වා ඇත.
- මාධ්‍ය භාවිතය. පිහිටි ගලක (ස්වභාවික ගල්පර්වතයක) කැටයම් කර ඇත.
- විවිධ ඉරියව්වලින් අල්ප උන්නත ශිල්ප ක්‍රමයට නෙළා ඇත.
- කලා ලක්ෂණ. - මහා බලිපුරම්හි ආකාශ ගංගාව රෝහණ කැටයමට සමාන බැවින් මෙය පල්ලව කලාවේ ලක්ෂණ
  ඇතැයි විචාරක අදහසයි.ඉතා සියුම් නිමාවකින් යුතුව ඇතුන්ගේ තාත්වික ක්‍රියාශීලී ස්වභාවය චලනය රිද්මය
  මනාව සම්පින්ඩනය කර ඇත.

02 ප්‍රතිමා කලාවේ සුවිශේෂී වෙනස්කම් ඇති කල යුගයක් ලෙස පොළොන්නරු යුගය හැඳින්විය හැකිය.

(1) පොළෙන්නරු යුගයට අයත් අධි උන්නත **ශෛලමය හිටි ප්‍රතිමා** දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(2) පොළොන්නරුව වටදාගෙයි බුද්ධ ප්‍රතිමා ගැන කෙටි විස්තරයක් කරන්න . (ලකුණු 05)
(3) මහායාන තන්ත්‍රයානික ලක්‍ෂණ පොළොන්නරු යුගයේ ප්‍රතිමා කෙරෙහි බලපා ඇති ආකාරය
උදාහරණ සහිතව පහදන්න. (ලකුණු 08)

(1) ගල් විහාරයේ අංක තුන හිටි ප්‍රතිමාව.
පොළොන්නරුවේ පොත්ගුල් විහාර ප්‍රතිමාව (මහා පැරකුම් ප්‍රතිමාව.)

(2) පොළොන්නරුවේ වටදාගේ ස්තූපයේ සතර දිශාවේ වැඩ සිටින බුද්ධ ප්‍රතිමා සතරක් ඇත.

- ශෛලමය මාධ්‍ය භාවිතය.
- දෑත ධ්‍යාන මුද්‍රාවෙන් යුක්තවීම
- දෙපා වීරාසන ක්‍රමයෙන් පිහිටුවීම.
- රැලි රහිත  චීවරය.
- හිසකෙස් රැලි රහිත ව යෙදීම හා උෂ්ණීසියක් හෝ සිරස්පතක් හෝ නොයෙදීම.
- පොළොන්නරු යුගයේ වෙනත් ප්‍රතිමාවලට වඩා අධ්‍යාත්මික ගුණයන් මුහුණින් නිරූපණය වීම.
- පූර්ණ උන්නතව නෙලා ඇත
- රැලි රහිත චීවරය හිසකෙස් සහිත බව ආදී ප්‍රතිමා ලක්ෂ නිසා මෙම පිළිම සතර පොළොන්නරු යුගයට පෙර
  කරන ලද බව සෙනරත් පරණවිතාන සහ කඹුරුපිටිය මන් අතර ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරයි.

(3) දකුණු ඉන්දීය චෝලවංශිකයින් විසින් පොළොන්නරුව රාජධානිය ඇරඹුණු ලැබීමත් සමඟ මුලින් බිහි වූයේ හින්දු දහම පදනම් කරගත් කලා නිර්මාණයන්ය.

- ද්‍රවිඩ පාලනය බිඳවැටීමෙන් අනතුරුව සිංහල රාජ්‍ය පාලනය සමඟ ඇරඹීමත් සමග නැවතත් බෞද්ධ කලා නිර්මාණ ඇරඹුණද ඒ කෙරෙහි ද්‍රවිඩ හින්දු සංස්කෘතිය නිසා ඇතිවූ උපසංස්කෘතියක් විසින් දැඩි බලපෑමක් එල්ල විය හින්දු දහම් හා මුසුවීමෙන් බිහි වූ මහායාන බුදු දහම මෙම කලා නිර්මාණයන්ට පාදක විය.
  මේ අවධියේ බුදුපිළිම අධ්‍යයනය කිරීමේදී කිසියම් සුවිශේෂ පවා දැකිය හැකිය.
  මේ සඳහා අනුගමනය කර ඇති ශෛලීන්ද ප්‍රතිමාවල ප්‍රකාශනයද ඒ සඳහා බලපා ඇති දාර්ශනික සිතුවිලිද විශේෂිතය.
- එම මහායාන තන්ත්‍රයාන ලක්ෂණ පොළොන්නරු ගල් විහාරයේ බුදුපිළිමවලට බෙහෙවින් බලපා ඇති බව පෙනේ.
- ගල් විහාරය බුදුපිළිම නෙලීමේදී ශිල්පියා පර්වතයේ ස්වභාවික පිහිටීම උපයෝගී කොට ගනිමින් පිළිම ස්ථාපනය කර ඇති අයුරු මෙහි ඇති සුවිශේෂී ලක්ෂණයකි.
- මෙය ඉන්දීය ද්‍රවිඩ කලාකරුවන්ගේ ලක්ෂණයකි ලක්ෂණයකි.
- ගල් විහාරයේ පළමුවන ප්‍රතිමාවේ , කුඩා විමාන තුළ ඇති ප්‍රතිමා සහ ප්‍රධාන පිළිමය සමඟ මෙහි පිළිම පහකි. ඒවා මහායාන බුද්ධාගමේ එන පංච ධ්‍යානි බුදුවරුන් සංකේතවත් කරන බව මතයකි - චන්ද්‍රා වික්‍රම වික්‍රමගේ.
- මෙම ප්‍රතිමාව නෙලා ඇත්තේ වජ්‍රාසනයක් මත වැඩ සිටින අයුරිනි. මහායාන ඉගැන්වීම් තුළ බහුලව වජ්‍ර සංකේත ගැන සඳහන් සඳහන්වේ. මෙසේ මෙම පිළිමයට වජ්‍ර සංකේතය එක්වීම් මහායාන මහායාන හා තන්ත්‍රයානික බලපෑම අනුව සිදුවූවක් බව.
- විමාන තුළ යොදා ඇති බුදුරුව වලින් මහායාන තන්ත්‍රයානික බුදුදහමේ ඉගැන්වෙන බෝධිසත්ත්ව සංකල්පය මූර්තිමත් වී ඇති අයුරු.
- විද්‍යාධර ගුහාවේ ඇති ප්‍රතිමාවේද වජ්‍රාසනය යොදා ඇති වජ්‍ර සංකේතය හා දේව රූප යොදා තිබීමෙන් මෙම පිළිමය තුළින්ද තන්ත්‍රයාණික ලක්ෂණ පිළිබිඹුවේ.
- තුන ප්‍රතිමාවේ බුදු පිළිමයට තිවංක හැඩ එක් වීම හින්දු දේව රූපවල ආභාසය අනුව සිදුවී යයි මතයකි.
- බුදුරුව පිටුපස දැක්වෙන තොරණක් බඳු කැටයම් සමූහය හා එහි ඇති නිර්මාණාත්මක අංග ආදිය පාල සේන යුගයේ මූර්ති තුළ බහුලව දක්නට ලැබෙන මහායාන බලපෑම් අනුව වූ නිර්මාණ බව

03 ශ්‍රී ලාංකේය විහාර බිතුසිතුවම් කලාව තුළ නව පිබිදීමක් ඇති කිරීමට 20 වන සියවසේ විහාර සිතුවම් ශිල්පීන් රැසක් පෙරමුණ ගත්හ.

(1) සෝලියස් මෙන්ඩිස් මහතා විසින් සිතුවම් නිර්මාණය කරනලද විහාරස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) බෙල්ලන්විල විහාරයේ දක්නට ලැබෙන සරණ මංගල්‍යය සිතුවම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05)

(3) 20 වන සියවසේ විහාර සිතුවම් ශිල්පීන් අපරදිග පෙරදිග කලා මූල තම සිතුවම් සඳහා භාවිත කර ඇති ආකාරය, උක්ත ශිල්පීන් **දෙදෙනෙකුගේ** සිතුවම් **දෙකක්** ඇසුරින් විමසන්න. (ලකුණු 08)

(1) රණස්ගල්ල විහාරය
ගිරිඋල්ල මැද්දෙපොළ විහාරය,
හබරාදූව පිටිදූව කැලණිගොඩ විහාරය
පොළොන්නරුව ශ්‍රී විජය විහාරය

(2) සෝමබන්ධ විද්‍යාපති මහතාගේ සිතුවමකි.

- සිදුහත් කුමරුන්ගේ සහ යසෝදරාවන්ගේ විවාහ මංගල්‍යය මෙයට වස්තු විෂය වී ඇත.
- ඔහු විසින්ම ගොඩනගා ගත් මානවරූප ස්වාධීන ශෛලියකින් යුක්තව යොදාගෙන ඇත.
- රේඛාව සහ වර්ණ කේන්ද්‍රීයව රූප ගොඩනගා ඇත.
- ලාලිත්‍යමය ස්වරූපයක් පෙන්වයි.
- ප්‍රධාන රූප යුගලය ක්ෂේත්‍ර වර්ණ වස්ත්‍රාභරණයෙන් සරසා තිබෙන අතර ඒ අදාළ චරිතවල පාරිශුද්ධත්වය පිළිබඳව ඇඟවීමක් ද වේ.
- රේඛාව කේන්ද්‍රීයව ගොඩනගා ඇත
- උණුසුම් වර්ණ මාලාවකින් පරිවාර රූප ඇඳ ඇත.
- සිදුහත් කුමරුන් යශෝධරාවන් අත මුදුවක් තබන අයුරු මෙහි නිරූපිතය.
- පරිවාර රූප යුවලට ආශීර්වාද කරති.

(3) විසිවන සියවසේ ශ්‍රී ලාංකීය විහාර බිතුසිතුවම් ශිල්පීන්
- එම් සාර්ලිස්
  සෝලියස් මැන්ඩිස්
  සෝමචන්ද්‍ර විද්‍යාපති.

- එම් සාර්ලිස්
  මහා මායා දේවියගේ සිහිනය
  සරණ මංගල්‍යය
- යුරෝපීය ස්වභාවිකවාදී චිත්‍ර සම්ප්‍රදායේ ලක්ෂණ අනුගමනය කිරීම.
- අඳුර දැක්වීම
- ත්‍රිමාන ලක්ෂණ
- පර්යාවලෝක මූලධර්ම.
- යුරෝපීය ක්‍රමවේද භාවිත කළ ද සිතුවම් වල ගොඩනැගිලි සහ වස්ත්‍රාභරණ ආදිය ඇඳ ඇත්තේ ඉන්දීය ආභාසයකිනි.
- සරණ මංගල්‍යය සිතුවමේ යුරෝපීය ක්‍රමවේද අනුගමනය කර ඇති අතර ඇඳුම් පැළඳුම් ආදී ඉන්දීය සංස්කෘතික ලක්ෂණ පළ කරයි.
- සිදුහත් කුමරු හා මව් බිසව සිතුවමද අපරදිග බටහිර ස්වභාවික ස්වභාවික වාදයේ චිත්‍ර ශෛලයේ ආභාසය අනුව රූප සංරචනය කර ඇත.
- පුනරුද යුගයේ චිත්‍ර ශිල්පීන් අඳින ලද මරිය තුමිය හා ජේසු බිළිදා දැක්වෙන මැඩෝනා චිත්‍රවල ආභාසය පෙන්වයි.

සෝලියස් මෙන්ඩිස්
- විසි වන සියවසේ ශ්‍රී ලාංකේය නූතන බෞද්ධ සිතුවම් කලාව පෙරදිග කලා මූලයන් ගුරුකට ගත් සම්ප්‍රදායක් බවට පත්කිරීමට පුරෝගාමී ශිල්පියකි.
- මුල් කාලීනව යුරෝපීය ස්වභාවික ස්වභාවික ස්වභාවිකවාදී ලක්ෂණ ගුරුකොට ගත්තද පසුව එම ශෛලිය බැහැර කරන ලදී.
- අජන්තා භාග් තිවංක පිළිමගෙය සහ නන්දලාල් බෝස්ගේ නිර්මාණ ආදී පෙරදිග රීතීන් ගරු කොටගත් කලා නිර්මාණ හා මූලාශ්‍ර ලත් ආභාසය.
- බුදුරජාණන් වහන්සේ මහියංගණයට වැඩම කිරීම
- ශ්‍රී පාද ලාංඡන පිහිටුවීම.
- ශ්‍රී මහා බෝධිය වැඩම කර වීම
- ශ්‍රී දන්තධාතුන් වහන්සේ වැඩම කරවීම
- අඳුර තුළින් ආලෝකය වඩාත් තීව්‍ර ලෙස මතු කර දක්වන කීරොස් කුරෝ සිද්ධාන්තයට සමාන වර්ණ ගැන්වීමේ ලක්ෂණ පෙන්වයි.
- ඉන්දියාවේ අජන්තා එල්ලෝරා හා භාග් වැනි ස්ථානවල කලා නිර්මාණ මෙන්ම ලංකාවේ සීගිරිය තිවංක පිළිමගේ චිත්‍රමය ලක්ෂණ ආභාසය ගෙන ඇත.
- ඉන්දීය සම්භාව්‍ය කලාවත් ලාංකීය සම්භාව්‍ය චිත්‍ර කලාවත් ගුරුකට ගෙන ඇත.

04 ඉන්දියාවේ මෝගල් අධිරාජ්‍ය කේන්ද්‍ර කොටගෙන ක්‍රි.ව 16 සියවසේ දී බිහි වූ මොගල් කලාවත් මෝගල් චිත්‍රකලාවේ බලපෑම ලබා බිහි වූ ප්‍රදේශීය චිත්‍ර ශෛලියක් ලෙස රාජ්පුත් චිත්‍ර කලාවත් ඉන්දීය චිත්‍ර කලාව නව මානයකට යොමු කරයි.

(1) රාජ්පුත් චිත්‍ර කලාව සඳහා තේමා වූ සාහිත්‍ය කෘති දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) "බාබූර් අධිරාජයා උද්‍යාන නිරීක්ෂණය." නම් සිතුවම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05)

(3) රාජ්පුත් චිත්‍රකලාවේ ශෛලිය, ශිල්ප ක්‍රම, මාධ්‍ය භාවිතය හා කලාත්මක ලක්ෂණ පිළිබඳ ව උදාහරණ සහිතව ඇගයීමක් කරන්න..

(1) රාමායනය
මහා භාරතය
භගවත් පුරාණය
ගීත ගෝවින්දය
රසික ප්‍රියය
චෞරය පංචසිකය
පරමාෂා

(2) ● රාජකීය ජීවිතයේ සංසිද්ධියක් නිරූපණය කර ඇත.
● චිත්‍රය කොටස් දෙකක් යටතේ සංරචනය කර ඇත.
● ඉහළ කොටස ගල්කුළු සහ මන්දිරයක් සහිත භූ දර්ශනයකට වෙන්කර ඇත.
● මෙයින් දැක්වෙන්නේ බාබර් අධිරාජයාගේ මාළිගාවයි.
● ගල්කුළු මැදින් පහළට ගලා එන කුඩා දිය පහරකි.
● එය රාජකීය උද්‍යානය මැදින් ගලායයි.
● චිත්‍රයේ මධ්‍යයට වන්නට සුදු පැහැති මලින් පිරුණු මල් ගසක් දක්වා ඇත.
● රජු අලංකාර සැරසිලි රටාවලින් මෝස්තර දැමූ රක්ත වර්ණ වශයෙන් ඇඳ සිටී.
● සමස්ත සිදුවීම චිත්‍ර ශිල්පියා ගොඩනගා ඇත්තේ තරමක් ඉහළ සිට එය නිරීක්ෂණය කරන අයුරකිනි.
● එම නිසා උද්‍යානයට අදාළ විස්තරත් පසුබිමට අදාළ විස්තරත් විශාල ප්‍රමාණයක් අන්තර්ගත කිරීමට ඔහුට සමත් වී ඇත.
● පෙර බිමේ මල්වලට සාත්තු කරමින් සිටින සේවකයෝ දෙදෙනෙකි
● සිතුවමෙහි සෑම කුඩා වස්තුවක්ම සැලකිල්ලෙන් සිතුවම් කර තිබේ..
● දියසායම් මාධ්‍යයට ආවේනික අයුරින් වර්ණ කර දැක්වීම දැකිය හැකිය.
● ආලෝකය වැටුණු තැන්වල ලා වර්ණයක් සෙවනැලි වැටී ඇති තැන්වල අඳුරු වර්ණයත් සමබරතාවයකින් යුතුව භාවිත කර ඇත

(3) ● රාජ් පුත් චිත්‍ර කලාව මෝගල් චිත්‍ර කලාවෙන් ආභාෂය ලබා බිහිවූ ප්‍රාදේශීය ශෛලියකි.
● මෝගල් චිත්‍ර කලාවට බෙහෙවින්ම සමානකමක් දක්වයි.
● රාජ්පුත් චිත්‍ර කලාව ප්‍රාදේශීය ලක්ෂණ පදනම් කරගෙන ප්‍රධාන කොටස් දෙකක් වශයෙන් ආනන්ද කුමාරස්වාමි මහතා හඳුන්වා දී තිබේ.
මධ්‍ය තැනිතලාබිමේ - රාජස්ථානයේ සම්ප්‍රදාය රාජපුට්
හිමාලය කඳු පාමුල - පහාරී සම්ප්‍රදාය කංග්‍රා
● තවත් බෙදීමක් අනුව රාජපුට් චිත්‍ර කලාව ප්‍රාදේශීය උපශෛලි සමූහයකට බෙදා වෙන් කරයි.
ජායිපූර් ශෛලිය
බුන්දි ශෛලිය
මැල්වා ශෛලිය

ශිල්පීය ක්‍රම.
● දියසායම් මාධ්‍යය ඔපෙක් ක්‍රමයට භාවිත කර ඇත.
● පර්යාවලෝක ලක්ෂණ පෙන්වා ඇත.
● ත්‍රිමාන ලක්ෂණ පෙන්වා ඇත.

මාධ්‍ය භාවිතය.
● දියසාය මාධ්‍ය ඔපෙක් ක්‍රමය
● කඩදාසි මත වර්ණ භාවිතයේදී අර්ථ නිරූපණය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වා ඇත.

- රතු වර්ණය බිය බිය බියද කහ වර්ණය ආශ්චර්යය ද
  දුඹුරු වර්ණයෙන් ශෘංගාරයද දක්වා ඇත.
- ද්විමාන වර්ණ භාවිතයක් දක්නට ලැබේ.
- විස්තරාත්මකව අංග ලක්ෂණ දැක්වීම සියුම් රේඛාකරණය උචිත වර්ණ සංකලනය ත්‍රිමාණ
  ලක්ෂණ පරියාවලෝකය.
- යම්කිසි සිද්ධියක් විස්තරාත්මකව ඇඳ දක්වා ඇත.
- සංකේතානුසාරයෙන් හැඟීම් ප්‍රකාශනය කර ඇත.
- මැල්වා ශෛලියේදී ඝණ බාහිර රේඛා දක්නට ලැබේ.

05 යුරෝපීය චිත්‍ර කලාවත් ඉන්දීය පෙරදිග කලාවත් තුළින් පෝෂණය වූ නව ඉන්දීය සිත්තරුන් පිරිසක් විවිධ කලා ව්‍යාපාර සහ ගුරුකුළ ඔස්සේ කලාවේ පෙරළියක් ඇති කළහ.

(1) ඉන්දීය නව ජීවන ව්‍යාපාරයේ පුරෝගාමී සිත්තරුන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(2) රාජා රවි වර්මාගේ සිතුවම්වල දක්නට ලැබෙන යුරෝපීය ශාස්ත්‍රාලයීය ලක්‍ෂණ පිළිබඳ කෙටියෙන්. පහදන්න. (ලකුණු 05)

(3) ජෙමිනි රෝයි සහ අම්රිතා ෂර්ගිල්ගේ සිතුවම් තුළ වස්තු විෂය හා කලාත්මක ප්‍රයෝග පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08)

(1) අභිනින්ද්‍රනාත්ඨාගෝර
නන්දලාල් බෝස්

(2)
- යුරෝපීය ශාස්ත්‍රාලී යථාර්ථවාදී චිත්‍ර කලා අනුගමනය කල ඉන්දීය ශිල්පියෙකි.
- මොහු භාවිතා කළ දෘශ්‍ය භාෂා ක්‍රමෝපායන් ඇන්ජිලෝ ඉන්දියානු සම්ප්‍රදාය ලෙස විචාරකය හඳුන්වයි.
- තෙල් සායම් මාධ්‍ය භාවිතය.
- ආලේක්‍ය චිත්‍ර නිර්මාණය
- මොහුගේ සිතුවම්
  සරස්වතී
  ඉන්ද්‍රජිත් ගේ ජයග්‍රහණය.
- එලිය අඳුර දැක්වීම
- පරියාවලෝකය
- ත්‍රිමාන ලක්ෂණ වර්ණ ප්‍රභේද.
- සෙවැනැලි දැක්වීම
- ඉන්ද්‍රජිත්ගේ ජයග්‍රහණය සිතුව සිතුවමේ ස්වභාවිකවාදී ලක්ෂණ මතුකර ඇත.

(3) ජෙමිනි රෝයි
- නූතන චිත්‍ර කලා සම්ප්‍රදායන් ගැන ගවේෂණාත්මක පර්යේෂණයක යෙදෙමින් නව නිර්මාණ රැසක් බිහි කළ ශිල්පියෙක්.
- ශාස්ත්‍රාලීය චිත්‍ර ශෛලි අධ්‍යයනය කරමින් තෙල් සායම් මාධ්‍යයෙන් හා දියසාම මාධ්‍යයෙන් චිත්‍ර ප්‍රගුණ කළ ශිල්පියෙකි.
- පසුකාලීනව ඔහුට ම ආවේනික චිත්‍ර ශෛලියක්ගොඩනඟා ගත්තේය.
- ඉන්දීය ජනකලා සම්ප්‍රදාය බෙහෙවින්ම ආභාසය ලැබූ සිත්තරෙකි.
- ඉන්දියානු ස්වදේශික කලා ලක්ෂණ සහ යුරෝපීය නූතන කලා ලක්ෂණ දැකිය හැකිය.
- සාම්ප්‍රදායික හෝ ශාස්ත්‍රාලීය හෝ චිත්‍ර කලාව තුළ අවධානය නොවූ තේමාවන් මූලාශ්‍ර වී ඇත
- සරලීකරණය දීප්තිමත් පැතිලි වර්ණ ඝණ බාහිර රේඛා ආදිය සිතුම් වල කැපී පෙනේ.
- මව සහ දරුවා , බලලා සහ පොකිරිස්සා මොහුගේ සිතුවම් දෙකකි.
- ත්‍රිමානත්වය බැහැර කොට සරලීකරණයකට ඇත.
- සුදු රෝස සහ අඳුරු කහ සහිත සීමිත වර්ණ මාලාවක් භාවිත කර ඇත.
- රේඛාව තුළින් අපූර්ව සෞන්දර්යයක් දැකීමට උත්සාහ කළ අතර වර්ණ තුළින් ඒ විචිත්‍රවත් කළහ.
- ග්‍රාමීය ප්‍රාදේශීය කලාවන් අධ්‍යනයනය කරමින් නව සම්ප්‍රදායන් චිත්‍රයට මුසු මුසුකරගත්තේය.
- පසුකාලීනව ඔහුගේ චිත්‍ර තුල තුළ රේඛාකරණයෙන් අනතුරුව හැඩතල පිරී යන සේ වර්ණ පූර්ණය කළ අතර හැඩතල වටා බාහිර රේඛාවක් ද යෙදීය.
- අලංකාර හැඩතල සහ සැරසිලි යොදා හැඩතල විසිතුරු කළේය.

- රේඛාවේ ලාලිතමය ස්වභාවය වෙනස් වී සරල ජාමිතික බවක් ගත්තේය.
- පසුබිම හිස්ව නොතබා තිරස් හා සිරස් හැඩතල තුළින් අලංකාර විය.
- මානව රූප ස්වභාවික පරිමාණයෙන් ඉවත්ව නිර්මාණාත්ම වූ බවක් ඉසිලීය.

  ක්‍රිස්තුන් වහන්සේ කුරිසේ රැගෙන යාම

  ක්‍රිස්තුස්වහන්සේ.
- විවෘත දිනෙන් දිගටිනාසය කුඩා දෙතුන් දිගටි මුහුණ හැඟුම්බරය.
- මව සහ දරුවා නිර්මාණය තුළින් සැරසිලි මාධ්‍යයට මුල් තැනක් දී ඇත.

අම්රිතා ශේර්ගිල්

- ශාස්ත්‍රාලීය අධ්‍යාපනයක් ලද ඇය බටහිර චිත්‍ර සම්ප්‍රදාය වූ පර්යාලෝකවාදී ශිල්ප ක්‍රමය හුරුපුරුදු කර අයෙකි.
- බෞද්ධ හින්දු වැනි විවිධ කලා නිර්මාණ අධ්‍යයනය කළ සේ ගිහින් ඒ තුළින් තමාටම ආවෙන්න එක ශෛලිය ගොඩනගා ගැනීමට සමත් විය.
- ඉන්දීය ජන ජීවිතයේ තොරතුරු පිළිබඳ ගවේෂණයක යෙදුණු ඇය අනේක විධි දුක් දොම්නසා ජීවත්වීමට දරන වෙහෙසකාරී පීඩාකාරී චරියාවන් ඉතා සංවේදීව විවරණය එක්ක යෙදීමට තම චිත්‍රය භාවිත කළහ.
- ඉන්දීය ලක්ෂණ හා භාවමය හැඟීම් මෙන්ම ජන ජීවිතයේ චර්යා රටා ඇඳුම් පැළඳුම් භාවිත මෙවලම් අර්ථවත්ව අවස්ථානෝචිතව යොදාගත් ශිල්පියෙකි.
- පසුකාලීනව ඔහුගේ සිතුවම් සඳහා තේමා වූයේ ස්වභාදහමේ සුන්දරත්වයයි.
- සරල හැඩතල භාවිතය හා වටකුරු හැඩ.
- අර්ථාන්විත වර්ණභාවිතයෙන් භාවමය ගුණ තීව්‍ර කිරීම.

  කඳුකර යුවතියෝ

  කඳුකර මිනිසුන්

  මනාලියක් හැඩ ගැන්වීම.

  ඉන්දීය කතුන්

  බ්‍රහ්මචාරී ඇයගේ සිතුවම් කිහිපයකි.
- අගහිඟකම් වලින් පිරි ජීවිතය අහිංසක මුහුණු ඇගේ චිත්‍රමය භාෂා ශෛලිය විය.
- බ්‍රහ්මචාරී එවැනිම නිර්මාණයකි.
- ලෝකෝත්තර හැඟීම් දනවන භාවාත්මක ප්‍රකාශනයකි.
- පූජකවරුන්ගේ අධ්‍යාත්මික ගුණ විදහා පෑමට ගත් දැඩි උත්සාහයකි.
- මානව රුව තුළින් ඉන්දීය ලක්ෂණ මැනවින් නිරූපණය කරයි.
- ගැහැණු ළමයි තිදෙනා සිතුවම තුළින් දීප්තිමත් හා වර්ණවත් ඇඳුමෙන් සැරසී සිටියද මුහුණේ ඇත්තේ සතුටින් තොර හැඟීමකි.
- බිත්තියට වැටී ඇති අඳුරු පැහැ සෙවනැලි ප්‍රබල සංකේතාර්ථයක් ධනවයි.
- මනාලියගේ දිය උල්හල නැමැති සිතුවම තුළින් යුරෝපීය ශාස්ත්‍රාල ශාස්ත්‍රාලය දැනුමෙන් පිටස්තරව කරන ලද නිර්මාණයකි.
- ඉන්දියානු ගැමි කලා ලක්ෂණද ස්වභාවිකවාදී ශෛලිගත චිත්‍ර ලක්ෂණ ද මෙම සිතුවමෙන් දැකිය හැක.
- පශ්චාත් උපශිතවාදී ලක්ෂණ ද මෙම සිතුව මේ රූපවල වර්ණ භාවිතයෙන් දැකගත හැකිය.
- නූතනවාදී කලා ප්‍රවණතා සහිත නිර්මාණයකි.
- ස්වභාවික වර්ණ මාලාවක් හා සම්භාව්‍ය  නොවන තේමාවක් මේ නිරූපිතය.

06 ක්‍රි.ව 14 - 16 වන සියවස්වල දී යුරෝපයේ විවිධ අංශයන්හි ඇති වූ පිබිදීම දෘෂ්‍ය කලාව තුළ මහත් පෙරළියක් ඇති කිරීමට සමත්වූහ.

(1) පුනරුදයේ ශිල්පියෙකු වන මයිකල් ආන්ජිලෝගේ මූර්ති දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) ශාස්ත්‍රාලයීය යතාර්ථවාදී කලාවේ පොදු ලක්ෂණ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.. (ලකුණු 05)

(3) "පර්වත මස්තකයේ" දෙව මැණියෝ සහ "පර්නාසස්" සිතුවම් දෙක පිළිබඳ තේමාව, වර්ණ භාවිතය මාධ්‍ය භාවිතය සහ කලා ලක්ෂණ පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 08)

(1) ඩේවිඩ් ප්‍රතිමාව

මියැදෙන වහලා

පියෙටා

මෝසෙස් පිළිරුව

(2) • බ්‍රිතාන්‍ය රාජකීය ශාස්ත්‍රාලය මූලික කොටගෙන ව්‍යාප්ත වූ රීතියකි.

- ප්‍රශස්ත සෞන්දර්ය රීතියකින් මිනිස් සිරුර නිරූපනය.
- සීමිත වර්ණ මාලාවක් යොදාගනිමින් සූක්ෂ්ම වර්ණවල මධ්‍ය පැහැය ගොඩනැගීමකි
- පර්යාවලෝක නීති නිවැරැදිව පිළිපැදීම
- ප්‍රශස්ත සෞන්දර්ය රීතියකින් නිශ්චල ද්‍රව්‍ය සහ භූමි දර්ශන ඇඳීම
- ද්‍රව්‍යවල ඝණනම හෝ ත්‍රිමාණ ලක්ෂණ මතු කිරීම
- ජීව චිත්‍ර ඇඳීම ජීව චිත්‍ර ඇඹීම සහ ජීව චිත්‍ර පින්තාරු කිරීම ආලේඛ්‍ය,භූමිදර්ශන ගැමිදර්ශන ඇඳීම

(3) "පර්වත මස්තකයේ දේව මැණියෝ"

- ලියනාඩෝ ඩා වින්චිගේ නිර්මාණයකි

තේමාව

- පර්වත මස්තකයේ දේවමැණියෝ සිතුවමෙන් දැක්වෙන්නේ මරියතුමිය අසලින් සිටින ජේසු බිළිඳා සහ ශාන්ත ජොන් බැප්ටිස් සමඟ සුරදූතියකි.

වර්ණ භාවිතය

- අඳුර තුළින් ආලෝකය වඩාත් තීව්‍ර ලෙස මතු කිරීම
  මෙම වර්ණ ගැන්වීමේ සිද්ධාන්තය කියරොස්කුරෝ ලෙස හඳින්වේ.
- දුඹුරු වර්ණයේ විවිධ ප්‍රභේද සහිත අඳුරු වර්ණමාලාවක් යොදා ඇති අතර අඳුර තුළින් මරියතුමියගේ හා දරුවන්ගේ මුහුණු වඩාත් ආලෝකමත්ව මතු කර දක්වා ඇත.

මාධ්‍ය භාවිතය

- කැන්වසය මත තෙල් සායම් මාධ්‍යයෙන් නිර්මාණය කර ඇත.
- ත්‍රිකෝණාකාර ආකෘතියක් මත රූප සම්පිණ්ඩනය කර ඇත.

කලා ලක්ෂණ

- ගල්කුළු පෙන්වා ඇති අතර පර්යාලෝක ලක්ෂණ සහිතව ඈතට විහිදී ගිය භූමි දර්ශනයක් නිරූපිත ය
- දේවමැණියන්ගේ මුහුණෙන් දැක්වෙන කරුණාභරිත බවත්, දරුවන්ගේ මොලකැටි බව මෙන් ම හැඟීම් ප්‍රකාශනය පෙන්වීමට
- ත්‍රිමාණ ලක්ෂණ

පර්නාසස්

- රෆායල් සන්සියෝ ගේ නිර්මාණයකි

තේමාව

- කාව්‍ය ශාස්ත්‍රය නිරූපණය කරන්නා වූ තේමාවකි.
- පර්නාසස් කඳු මුදුනේ රැස්ව සිටින කාව්‍ය කරණයට සම්බන්ධ විවිධ කලාපරාසයන්ට අයත් චරිත සමූහයක්

වර්ණ භාවිතය

- මානව රුවේ නිරවද්‍ය බව සමග මුසුවූ සුන්දර වර්ණ මාලාවක් ඇත
- ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාවලෝක ලක්ෂණ
- දුඹුරු වර්ණයේ විවිධ ප්‍රභේද, අඳුරු කහ වර්ණවල විවිධ ප්‍රභේද, රතු රඹ සහ සුදු ආදී වර්ණයන් සිතුවම සඳහා භාවිත කර ඇත

මාධ්‍ය භාවිතය
- සිතුවම නිර්මාණය කර ඇත්තේ රෝමයේ ස්ටැන්සා ඩෙලා සිගන්චුරා නැමැති ගොඩනැගිලි බිත්තියක තෙල් සායම් භාවිතය
- ප්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමයට නිර්මාණය කරන ලද්දකි.

කලා ලක්ෂණ
- සුන්දර පරිසරයක් ඉතා තාත්විකව දක්වා ඇත.
- මානව රූපවල ක්‍රියාකාරී ඉරියව්
- හැඟීම් ප්‍රකාශිත මුහුණු
- ත්‍රිමාණ ලක්ෂණ පර්යාවලෝක ලක්ෂණ

07 ප්‍රාග් ඓතිහාසික යුගයේ විවිධ භූගෝලීය කළාප තුළ මානවයින් තම ජීවින ක්‍රියාධාමය තුළින් ශේෂ වූ දෘෂ්‍යමය සාධක කලාවේ මංපෙත් විවරකරයි.

(1) ප්‍රාග් ඓතිහාසික මානවයින් සිතුවම් ඇඳීම සඳහා භාවිත කළ ශිල්ප ක්‍රම දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) අදි මානවයින් ගේ සිතුවම් සඳහා වස්තුවිෂය වූ කරුණු පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05)

(3) යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පසු ඇරඹි මිසර ශිෂ්ඨාචාරය හරහා ලොවට දායාද වූ වාස්තු විද්‍යා නිර්මාණ පිළිබඳ උදාහරණ සහිත විමසුමක් කරන්න. (ලකුණු 08)

(1) ● ඇඳීම - රේඛා චිත්‍ර

ගල් පෘෂ්ඨය සූරා නිර්මාණය කරන ලද රූප - උත්කීරණ

මුද්‍රා තබන ලද අත් හා පා සලකුණු

(2)
- දඩයම් අවස්ථා සුලබ කර ගැනීම
- භූතාත්ම පිදීම
- විවේක ගත කිරීම
- දඩයම් පහසු කර ගැනීම
- සංනිවේදන කාර්‍ය්‍ය - අදහස් හුවමාරු
- සත්ත්ව රූප - බයිසන් ගවයින්, පිනි මුවන් ,මැමැත් අශ්වයින්
- මානව රූප -
- විවිධ සංකේත

(3)
- නයිල් ගංගාධාරය පදනම් ව ව්‍යාප්ත වූ ලෝකයේ ඉපැරණි ම ශිෂ්ටාචාරයක් වන ඊජිප්තු ශිෂ්ටාචාරය ක්‍රි. පූ. 3000 - 30 අතර කාල පරාසයට අයත් වේ.
- ඊජිප්තුව පාරාවරුන්ගේ බල පරාක්‍රමය ලොවට කියාපාන සුවිශාල පිරමීඩ, ගෘහ නිර්මාණ, චිත්‍ර මූර්ති ආදී කලා නිර්මාණ සඳහා පදනම විය.
- ඊජිප්තු වාස්තු විද්‍යාවට මූලිකම පදනම වූයේ මරණින් මතු පැවැත්ම යන ඇදහිලි විශ්වාස මතය.
- ඊජිප්තු ගෘහ නිර්මාණ, සොහොන් ගෙවල් , පිරමීඩ, හා දේවස්ථාන වශයෙන් වේ.
- මුල් කාලීනව මෘත ශරීර තැනපත් කරන ලද්දේ වැලිතලයේ හාරන ලද වලවල්වල බහා වැලිවලින් වැසීමෙනි. ඒ මත ගල් හෝ අතුරිකිලි තබා ආවරණය කරයි
- පසුව මස්ටාබා නිර්මාණය විය
- පසුව මස්ටාබා කිහිපයක් එක මත එක ඉදිකිරීමෙන් පඩි පිරමීඩ බිහිවිය.
- පඩි පිරමීඩ ආරම්බ කරන ලද්දේ ජෝසර්ගේ පාලන සමයේදීය.
- පිරමීඩ බිහිවීම වඩාත් ප්‍රකට පිරමීඩ හමුවන්නේ පැරණි රාජධානි සමයේදීය.

  කුෆු පිරමීඩය - විශාලතම පිරමීඩය

  කාෆ්රේ පිරමීඩය -

  මෙන් කවුරේ
- නව රාජධානි සමයේදී දේවස්ථාන සහ පර්වත හාරා කළ සොහොන් ගැබ් ඉදිවේ

  අබුසිම්බල් දෙවස්ථානය - දෙවැනි රැමෙසස් රජු

  ලුක්සෝර් දේවස්ථානය - විශාල ආගමික ගොඩැනැලි සංකීර්ණයකි.
- කුළුණු පදනම් කරගෙන ඉදිකරන ලද දේවස්ථාන

  කානැක් දේවාල සංකීර්ණය

  එඩ්ෆූ දෙවොල - හෝරස් දෙවිවන් උදෙසා